**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|
| අන් සතු දේපළක් ජංගම නොවන වත්කම් ලෙස සලකා තිබීම | 1.6.1(ඒ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රජයේ නිවාස හා බංගලා ආදියෙන් අයකළ කුලී ආදායම් රු.280,438ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේදී ආදායම් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. | සියලුම කුලී ආදායම් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සහ අත්තිකාරම් ගිණුම් ප්‍රකාශය අතර රු.5,032,037 ක වෙනසක් පැවැතිණි. | සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 1 හි මෙය නිවැරදිව දක්වා ඇත. | ගිණුම් ප්‍රකාශ අතර සමාන සංඛ්‍යා සැසඳීමට හැකි විය යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල නිවැරදි තක්සේරු වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් වටිනාකම රු.77,621,167කින් අඩු වී තිබුණි. | වර්තමානයේ සිගාස් මෘදුකාංගයේ නිවැරදි වටිනාකම දක්වා ඇත. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අයත් ගොඩනැගිලි 05ක් හා මෝටර් සයිකල් 11ක් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම්වල නිවැරදි වටිනාකම පිළිඹිබු නොවුණි. | අදාල වත්කම්වල තක්සේරු වටිනාකම් ලද පසු ගිණුම්ගත කරනු ලැබේ. | -එම- |
| (ඉ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් ශේෂය සහ 2021 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර සටහන් අනුව එම ශේෂය සමාන විය යුතු වුවත්, ඒ අතර රු.55,071,292 ක වෙනසක් පැවැතිණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග මෙම කරුණ සාකච්ඡා කර නිවැරදි කිරීමට පියවර ගෙන | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ඇත. | |
| (ඊ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක පැවැති රු.256,500ක් වූ යතුරු පැදි 09ක අපහරණය ගිණුම්ගත නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | අපහරණය ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | -එම- |
| (උ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රු.2,600,000ක් වටිනා වෑන් රථයක් ගිණුම්ගත නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වාහනයේ වටිනාකම කඩිනමින් ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. | -එම- |
| (ඌ) | භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වලට වඩා රු.55,145,349 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග මෙම කරුණ සාකච්ඡා කර නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | -එම- |
| (එ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ස්ථාවර වත්කම්වලට සිදු වූ රු.2,663,709 ක හානියක් ගිණුම්ගත කර නොතිබුණි. | දෝෂයකින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ගනුදෙනු නිසි පරිදි ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි රු.මිලියන 2 ක් වූ ඉඩම පුද්ගලික පාර්ශවයකට අයත් වුවද, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම්වල දක්වා තිබුණි. මෙම ඉඩමේ කාර්යාල ගොඩනැගිල්ලක් රු.මිලියන 58.14කට ඉදිකර තිබුණද ඉඩමේ අයිතිය පවරා ගැනීමට 2020 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පුද්ගලික ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඔ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වා ගෙන නොමැති අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී හෙළිදරව් විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පසුගිය වර්ෂ 08කට අධික කාලයක සිට යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |
| (iii) **පාඩු පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු පිළිබඳ ලේඛනයක් මේ දක්වා යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iv) **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | -එම- | -එම- |
| (v) **ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගැයීම් කමිටුවේ පැමිණීමේ ලේඛනය**<br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පසුගිය වර්ෂ 08කට අධික කාලයක සිට යාවත්කාලින ලෙස පවත්වා නොතිබුණි. | -එම- | -එම- |
| (vi) **ලංසු කැඳවීමේ ලේඛනය**<br>ලංසු කැඳවීමේ ලේඛනයක් පසුගිය වර්ෂ 08කට අධික කාලයක සිට යාවත්කාලීන ලෙස පවත්වා නොතිබුණි. | -එම- | -එම- |
| (vii) **ස්ථාවර වත්කම් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ඨයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | -එම- | -එම- |

**(ඕ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් ඉඩමක වටිනාකම රු.13,200,000ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් කර තිබුණද, එහි හිමිකාරිත්වය පිළිබඳ සාක්ෂි නොපැවැතිණි. | රජයට පවරා ගැනීම සඳහා 2021 වර්ෂයේදී ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබුණි. එසේ පවරා ගත්විට සිගාස් මෘදුකාංග පැකේජයේ ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. | ඉඩමෙහි අයිතිය තහවුරු කළ හැකි සාක්ෂි ලබාගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිසි පරිදි වියදම් ඇස්තමේන්තු කර නොතිබීම නිසා වැය විෂයයන් 08 ක පැවැති රු. 12,710,000ක් වූ ප්‍රතිපාදන ඉතිරි වීම් වෙනත් වැය විෂයයන් වෙත මාරුකර තිබුණි. | වැය විෂයන් අතර මාරුකිරීම් සිදුකිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ එකඟතාව මත සිදුකරන ලදී. | වියදම් සඳහා නිසි පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක 08/2019 දරන චක්‍රලේඛයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් සංග්‍රහ වියදම් රු. 210,000, මාසික දීමනා ලෙස වැටුපට එකතු කර ලබා දී තිබුණි. | වර්තමානයේ වෙනම ගෙවීම් කටයුතු සිදුකර කෙරේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී ඉටුකළ රු.1,068,434,962 ක කාර්යයන් සඳහා අක් මුදල් නොලද බැවින් ගෙවීම් කළ නොහැකිව බැරකම් ලෙස පැවැතිණි. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් නිදහස් නොකිරීම නිසා ඒවා අතැති බිල්පත් ලෙස දක්වා ඇත. | අක්මුදල් ලද විගස බැරකම් පියවා දැමීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 19 කින් ලද රු.3,263,094,323 ක ප්‍රතිපාදනවලින් රු.1,125,558,486 ක් හෙවත් සියයට 34 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් ඒ ඒ වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ත්, සියයට 100 ත් අතර පරාසයක විය. | භාණ්ඩාගාරය විසින් අක් මුදල් නිදහස් නොකිරීමත්, වැය විෂයයන්ගේ ප්‍රතිපාදන අවුරා තැබීමත් මීට හේතු වී තිබුණි. | -එම- |

## 2.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 35 වැනි අතිරේකය පරිදි ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවකට භාණ්ඩ මිල දී ගැනීම් සඳහා උපරිම සීමාව රු. මිලියන 01 ක් වුවත්, එම සීමාව ඉක්මවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් විසින් එකතුව රු.35,924,074 ක මිල දී ගැනීම් සිදුකර තිබුණි. | ඉදිරියේදි මෙවැනි දෝෂ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි කටයුතු කළ යුතුය. |
| **(ආ)** ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් මුදල් රෙගුලාසි 137 ට පටහැනිව, ගෙවීම් සඳහා අනුමැතියක් රහිතව රු. 2,916,452 ක වවුචර් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | -එම- | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් මුදල් රෙගුලාසි 138 සහ 257 ට පටහැනිව, ගෙවීම් සහතික නොකළ රු.4,625,338 ක වවුචර් සඳහා ගෙවීම් කර තිබුණි. | -එම- | -එම- |
| (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් මුදල් රෙගුලාසි 137, 138, 139 සහ 237 ට පටහැනිව,ගෙවීම් තහවුරු කිරීමේ සාක්ෂි රහිත වවුචර් වෙනුවෙන් රු.33,723,077 ක් ගෙවීම් කර තිබුණි. | ඇතැම් උපකාරක ලියවිලිවල අඩුපාඩු මේ වන විට නිවැරදි කර ඇත. | -එම- |
| (iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් මුදල් රෙගුලාසි 137 සහ 138 ට පටහැනිව, භාණ්ඩ හා සේවා ලබා ගැනීමට පෙර රු.119,543,789 කට චෙක්පත් 300 ක් ලියා ඒවා කාර්යාලයේ රඳවා ගෙන තිබුණි. | මේ වන විට අඩුපාඩු නිවැරදි කර ඉහත චෙක්පත් අදාළ අයට ලබා දී ඇත. | -එම- |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් තෙවැනි පාර්ශවයන්ට ලබාදිය යුතු ගෙවීම්වල එකතුව රු.393,990 ක් මාස 06 කට අධික කාලයක් අදාල පුද්ගලයින්ට ලබා නොදී තාවකාලික තැන්පතු ගිණුමේ රඳවා තබා තිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම තාවකාලික තැන්පතු කඩිනමින් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | ඉහළ තාක්ෂණයකින් යුතු මළපවහන පද්ධති 03 ක් ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් වෙත ලද රු.23,728,618 ක් ලැබී තිබුණි. එම මුදල් වැයකර අදාළ කාර්ය ඉටු කිරීමට හෝ නිරවුල් කිරීමට හෝ පියවර නොගෙන මාස 06 සිට වර්ෂ 03ක් දක්වා කාලයක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ඉහත තැන්පතු කඩිනමින් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මෙම තැන්පතු අදාල පාර්ශවයන්ට නියමිත කාලය තුළ ආපසු භාරදීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (iii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වූ තැන්පතුවලින් සිදුකළ ගෙවීම් රු.2,037,026 ක් මුදල් රෙගුලාසි 206 පරිදි වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කර නොතිබුණි. | වර්තමානයේ සියලුම වවුචර් නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (iv) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක එකතුව රු. 1,643,767 ක් වූ රඳවා ගැනීම් තැන්පතු 06 ක් මුදල් රෙගුලාසි 571 ට පටහැනිව, වර්ෂ 02 කට වැඩි කාලයක සිට තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | -එම- |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු එකතුව රු. 16,382,753ක් වූ චෙක්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් අත රඳවා ගෙන තිබුණු අතර මුදල් රෙගුලාසි 141 හා 386ට පටහැනිව එම චෙක්පත්වල අණකරුවන්ගේ අත්සන් පවා යොදා නොතිබුණි. | වර්තමානයේ සියලු කාරණා නිවැරදි කර චෙක්පත් අදාළ අයට ලබා දී ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිර්වෙලි අළුකෙසෙල් කැබලි (Chips) නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ ස්ථාපිත කර 2020 ජූනි මාසයේදී නිර්වෙලි අළුකෙසෙල් නිෂ්පාදක, විකුණුම් සමුපකාර සමිතිය වෙත පවරා තිබුණි. එදින සිට මේ දක්වා වර්ෂ 02 ක කාලයක සිට එම සියලු වත්කම් භාවිතයෙන් තොරව හා නිසි නඩත්තුවක් නොමැතිව පවතී. නිෂ්පාදන වියදම් අධික බවත්, නිෂ්පාදන අවශ්‍යතාවට එම යන්ත්‍රය නුසුදුසු බවත් අදාළ සමුපකාර සමිති පරිපාලනයේ මතය වී තිබුණි. කෙසේවුවත්, නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ රු.10,325,421 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | මෙම යන්ත්‍ර භාවිතා කර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන බව දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් දැනුම් දී ඇත. | ව්‍යාපෘති සිදුකිරීමට ප්‍රථම නිවැරදිව සැලැසුම් කිරීමටත්, තාක්ෂණික ඇගැයීම් සිදුකිරීම මගින් ඒවා සාර්ථක කර ගැනීමටත් හා භාවිතයට නොගන්නා වත්කම් ඵලදායි ආකාරයෙන් භාවිතා කිරීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ජීවනෝපාය පුහුණු මධ්‍යස්ථානයක් වෙනුවෙන් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2020 වර්ෂයේදී රු. 1,980,000 ක් වැයකර ගොඩනැගිල්ලේ අත්තිවාරම හා කුළුණු කිහිපයක් පමණක් නිමකර, පසුව එම ඉදි කිරීම් අත්හැර දමා තිබුණි. | මෙම පුහුණු මධ්‍යස්ථානය භාවිතා කරන බව පිළිතුරු ලෙස දක්වා තිබුණ ද, එය සාවද්‍ය ප්‍රකාශයක් බව භෞතික විගණන පරීක්ෂාවක දී හෙළිදරව් විය. | -එම- |

## 3.2 ප්‍රසම්පාදනය

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණු අවස්ථා පහත පරිදි විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර රු.1,672,462 ක භාණ්ඩ මිල දී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මිල දී ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම නිසා ඒ වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාගත් ප්රසම්පාදන තීරණ පදනම් කරගෙන මිල දී ගැනීම් සිදු කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.6 වගන්තියට පටහැනිව මුල් ගිවිසුම් වටිනාකමෙන් සියයට 50ක් දක්වා නැවත මිල දී ගැනීමට පවතින සීමාව ඉක්මවා සියයට 60ත් සියයට 24700ත් අතර පරාසයක් තුළ රු. 30,201,478ක භාණ්ඩ ප්‍රති ඇණවුම් මගින් මිල දී ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක් විසින් කටයුතු කර තිබුණි. | ඉදිරියේදි මෙවැනි විෂයන් සඳහා වැඩි අවධානය යොමුකරනු ලැබේ. | - එම - |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.1 හා 4.4 ප්‍රකාරව එකම ප්‍රසම්පාදනය කොටස් නොකර එක්වර සිදුකළ යුතු වුවත්, සාධාරණ හේතු නොමැතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් එකතුව රු.8,207,258ක් වූ ව්‍යාපෘති 02ක් කොටස් කිහිපයකට වෙන්කර ප්‍රසම්පාදය සිදුකර තිබුණි. | ඒ වන විටත් ලැබී තිබුණු ඉල්ලීම් කොටස් වශයෙන් ප්‍රසම්පාදනයන් කර මිල දී ගැනීම් සිදු විය. එමෙන්ම, ඩොලර් හිඟය නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් එකඟ වූ මිල ගණන්වලට වැඩිපුර භාණ්ඩ ලබාදීමට ඉදිරිපත් නොවීම හේතුවෙන් නැවත ලංසු කැඳවීමට ද සිදු විය. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.8 (අ) ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් රු.290,366 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණ ලබා නොගෙන කර්මාන්ත 02 ක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර තිබුණි. | දෝෂයකින් කොන්ත්‍රාත්කරුගෙන් කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. එහෙත්, කාර්යයන් නියමිත කාලපරිච්ඡේදය තුළ ඉටු කර තිබුණි. ඉදිරියේදි මෙවැනි කාරණා සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. | කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන ගිවිසුම් අත්සන් කළ යුතුය. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.9 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් ප්‍රදානය කළ එක් ප්‍රසම්පාදනයක වටිනාකම රු.500,000 කට වඩා වැඩි එකතුව රු.8,432,824 ක් වූ භාණ්ඩ මිල දී ගැනීම් 03 ක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ඉදිරියේදි මෙවැනි විෂයයන් සඳහා වැඩි අවධානයක් යොමුකරන ලෙසට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------- | ----------------- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කැඳවූ ලංසු මිල ගණන් මත භාණ්ඩ මිල දී නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නැවත මිල ගණන් කැඳවා ඊට වැඩි මිලකට භාණ්ඩ මිල දී ගැනීම නිසා රු.1,763,627 ක මූල්‍යමය හානියක් සිදු වී තිබුණි. | ඇණවුම් වැඩි සංඛ්‍යාවක් සැපයුම්කරුට ලබා දීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කැඳවූ ලංසු මිල ගණන් මත භාණ්ඩ සැපයීමට නොහැකි බවට දැන්වීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාගත් ලංසු මිලගණන්වලට අනුව මිල දී ගැනීම් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එක් ප්‍රසම්පාදනයකින් මිල දී ගත හැකි ව තිබුණු ජල පිරවීම් යන්ත්‍ර 02 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන 02 කින් මිලදී ගැනීම හේතුවෙන් රු.724,293 ක පාඩුවක් සිදු වී තිබුණි. | ඩොලර් හිඟය මත පැවැති ලංසු මිල ගණන්වලට තවදුරටත් භාණ්ඩ සැපයිය නොහැකි බව දැන්වීම නිසා නැවත ලංසු කැඳවා තිබුණි. | - එම - |
| (ඇ) | 2019 වර්ෂයේදි නිම විය යුතු පිරිවැය රු.56,640,750 ක් වූ කිරි කල්තබා ගැනීමේ ව්‍යාපෘතිය 2022 ජූලි දක්වාම නිමකර නොතිබුණි. එහෙත්, රු.4,822,238 ක් වූ කාර්යසාධන සුරක්ෂණයේ මුල් පිටපත ලබා නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගිවිසුම් අත්සන් කර තිබීම නිසා ගිවිසුම් උල්ලංඝනය කිරීමට එරෙහිව එම සුරක්ෂණ ආදායමට බැරකරගත නොහැකි වී තිබුණි. | ගොඩනැගිලි ඉදිකළ ප්‍රමාණයට ගෙවීම් කර ඇති අතර යන්ත්‍රෝපකරණවලින් කොටසක් ලැබී තිබුණ ද ඒ සඳහා ගෙවීම් කර නොතිබුණි. කාර්යසාධන සුරක්ෂණය කොන්ත්‍රාත්කරු විසින් දීර්ඝ කර ලබා දී නොතිබුණු අතර දෝෂයකින් එම සුරක්ෂණය මුදල් බවට මාරුකර නොතිබුණි. එනමුත්, මේ වන විට කාර්යයන් අවසන් කිරීමේ පදනමින් (Termination) කටයුතු කරමින් පවතී. | ඇප බැඳුම්කරයෙහි මුල් පිටපත් ලබාගෙන ගිවිසුම් අත්සන් කළ යුතුය. |

**3.4 අභ්‍යන්තර පාලන දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවීම් නිලධාරී විසින් ආදායකයා වෙත භාරදීම වෙනුවට චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයේ විෂයභාර නිලධාරීන් විසින් කෙටිසන් තබා චෙක්පත් ලබාගෙන තිබුණු අවස්ථා පැවැති බව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සිදුකළ විගණන නියැදි පරීක්ෂණවල දී නිරීක්ෂණය විය. | ලබාගත් අයගේ අත්සන සහ රබර් මුද්‍රාව චෙක් පිළිපතේ සටහන්කර චෙක්පත් නිකුත්කර තිබුණි. | ආදායකයා වෙත චෙක්පත් භාර දීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 1456 කින් 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 188 ක් හා 485 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. | පිළිගනිමි. | අවශ්‍යතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩලය වෙනත් කාර්යාල වලට අනුයුක්ත කිරීමටත් අදාල කටයුතු කළ යුතුය. |